©Mahinda Rajapaksa [MFA UoK, BA (Hons) sp UoK, Dip in Education UoP] **20220101**

කෑ/බණ්ඩාරනායක මහා විද්‍යාලය K/Bandaranayaka Maha Vidyalaya

**කෑ/බණ්ඩාරනායක මහා විද්‍යාලය**
**K/Bandaranayaka Maha Vidyalaya**

**43 S 1**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| II | |
| III | |
| එකතුව | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 ජනවාරි**
**General Certificate of Education (Ord. Level) Examination, January 2021**

**චිත්‍ර I**
**Art I**

*පැය එකයි*
***One hour***

* සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

නම :.......................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. පොලොන්නරු යුගයට අයත් මෙම සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ඉදි කිරීම ....................................... ලෙස හඳුන්වයි.

2. දළඳා මලුවේ ඇති ගල්පොත සෙල්ලිපියට අනුව මෙම ඉදිකිරීම ....................................................... රජුගේ අනුග්‍රහයෙන් සිදු කළ බව සඳහන් ය.

3. මෙම ඉදිකිරීමට අයත් මිටි බැම්මෙහි සිවු පෙති ........................................................................ මල් රටාව යෙදූ අලංකාර මෝස්තරයක් දක්නට ලැබේ.

4. පොලොන්නරු යුගයට අයත් කලාත්මක මුරගල සහ ............................................................... මෙම ගොඩනැගිල්ලේ උතුරු දොරටුව ආශ්‍රයෙන් හමුවේ.

5. මෙම ගොඩනැගිල්ලේ ඇති චෛත්‍යයේ සිවු දිශාවට මුහුණලා කලාත්මක ................................... සතරක් දක්නට ලැබේ.

- අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

6. ඉන්දීය තන්ජාවූර් සිතුවම් කලාව, යුරෝපා යථාර්ථවාදී සිතුවම් කලාව සහ පෙරදිග සිතුවම්වල සම්මිශ්‍රණයෙන් සිතුවම් ඇඳි ශ්‍රී ලාංකික දමිළ චිත්‍ර ශිල්පියා කවු ද?
......................................................................................................................................................

7. කේ. කනකසබාපති චිත්‍ර ශිල්පියා විසින් ඝනිකවාදී ලක්ෂණ සහිතව උද්වේගකර රිද්මයක් ප්‍රකාශවන අයුරින් කළ තෙල් සායම් සිතුවම කුමක් ද?
......................................................................................................................................................

8. ගජමෑන් සහ මගෝඩිස්තුමා යන චරිත මඟින් ශ්‍රී ලාංකික දේශපාලනය උපහාසයට පත්කළ විශිෂ්ට කාටූන් ශිල්පියා කවරෙක් ද?
......................................................................................................................................................

9. මුල් කාලීන සිතුවම් සඳහා ස්වභාවික රූප ද පසු කාලීන නිර්මාණ සඳහා අධිතාත්වික සහ සමධිගත වින්දනයකට තුඩුදෙන හැඩතල සංනිදර්ශන සිතුවම් සඳහා භාවිත කළ ශිල්පියා කවු ද?
......................................................................................................................................................

10. ශක්තිය, නිර්භීතභාවය සහ මානව දයාව, තාරුණ්‍ය වැනි ගුණාංග ප්‍රකාශවන මයිකල් ආන්ජලෝ ශිල්පියා විසින් කළ මූර්තිය කුමක් ද?
......................................................................................................................................................

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරැදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

11. **දියසායම්** මාධ්‍යයේ අනන්‍ය වූ ලක්ෂණයක් වන්නේ.

(1) විනිවිද පෙනීමයි. (2) ඉක්මනින් වියළීමයි.
(3) මිශ්‍ර කිරීමට ඇති හැකියාවයි. (4) පහසුවෙන් භාවිත කළ හැකි වීමයි.

12. **චාරුලේඛන (Calligraphy)** කලාව හමු වනුයේ,

(1) රෝමානු කතෝලික පල්ලියෙනි. (2) හින්දු කෝවිල ආශ්‍රිතව ය.
(3) ගොතික පල්ලිය ආශ්‍රිතව ය. (4) ඉස්ලාම් මස්ජිදය ආශ්‍රිතව ය.

13. **ඇතා සහ පැටවා** දැක්වෙන උත්කීර්ණ සටහන හමුවන ලෙන,

(1) බටදොඹ ලෙනයි. (2) බිල්ලෑව ලෙනයි.
(3) දොරවක ලෙනයි. (4) තන්තිරිමලේ ලෙනයි.

14. ඉන්දු නිම්න **පශුපති මුද්‍රාව** මඟින් සංකේතවත් වනුයේ,

(1) වෙළඳ කටයුතු වලදී යොදාගත් බවකි. (2) කෘෂි කර්මාන්තයට අධිපති ශිව වේෂයකි.
(3) විවිධ ඇදහිලි හා සම්බන්ධ බවකි. (4) ඉන්දු නිම්න වැසියාගේ මුද්‍රාවකි.

15. **කුරුලු දඩයම** නම් ඊජිප්තු නව රාජධානි අවධියට අයත් සිතුවම පිළිබඳ අදාළ **නොවන්නේ** කුමක් ද?

(1) මානව රූ ශෛලීගත අයුරින් නිරූපිතය. (2) සත්ව හා ශාක ස්වභාවික නිරූපණයකි.
(3) ප්‍රෙස්කෝ බුවනෝ ශිල්පක්‍රමයට අයත් ය. (4) සිදු වීම් ගණනක් සහිත තීරු සංරචනයකි.

- අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. **ක්ෂයවෘද්ධි** ......................................................................................................

17. **සාල භංජිකා** ......................................................................................................

18. **ත්‍රිකෝණාකාර ආකෘතිය** ......................................................................................

19. **වලිච්චි ගෑම** ......................................................................................................

20. **කිරි හිඳවීම** ......................................................................................................

- අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.


21. 



A


(............)

22. 



B


(............)

23. 



C

(............)

24. 



D

(............)

25. 



E

(............)

- අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

26. සේනාධිලංකාර අමාත්‍යයගේ මූලිකත්වයෙන් ගණේශ්වරාචාර්ය ශිල්පියා කළ ගම්පොළ අවධියට අයත් ...................................................... ද්‍රවිඩ ගෘහ නිර්මාණ ලක්ෂණ පෙන්වන බෞද්ධ විහාරයකි.

27. ඊජිප්තු අමර්ණා කලා නිර්මාණ අතර ශෛලිගත සම්ප්‍රදායෙන් මිදී ස්වභාවික ලක්ෂණ පෙන්වන මූර්තිය ........................................................................................................................ මූර්තියයි.

28. බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ පෙන්වන ................................................................ සිතුවම ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ විශිෂ්ට නිර්මාණයකි.

29. ඉන්දීය අජන්තා සිතුවම්වල දක්නට ලැබෙන භාවමය හා රූපමය ලක්ෂණ පිළිබිඹුවන ලංකාවේ අනුරාධපුර අවධියට අයත් සිතුවම් සමූහයක් ........................................................................ හමු වේ.

30. පර්යාවලෝකන ලක්ෂණ සහිත බුදුන් වහන්සේ කිඹුල්වත් පුරට වැඩම වීම අජන්තා අංක .............................................................. ගුහාවේ දක්නට ලැබෙන සිතුවමකි.

- අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

**31.** **F** අක්ෂරයෙන් චූනාර් නම් හුණු ගල් විශේෂයෙන් කළ ගුප්ත කලා ලක්ෂණ පෙන්වන ........................................................................................................ බුද්ධ ප්‍රතිමාව පිළිබිඹු වේ.

**32.** **G** අක්ෂරයෙන් දැක්වෙන ග්‍රීක හෙලනිස්ටික නිර්මාණය ...................................................................... ශිල්පියා කළ වීනස් ප්‍රතිමාවයි.

**33.** **H** අක්ෂරයෙන් දැක්වෙ ග්‍රීක සම්භාව්‍ය කලා ලක්ෂණ පෙන්වන ....................................................... මූර්තියේ මුල් නිර්මාණය මයිරන් විසින් කරන ලද්දකි.

**34.** **I** අක්ෂරයෙන් දැක්වෙන සාංචි තොරණට අයත් උඩලිපත් දරා සිටින සුවිශේෂ වාස්තු විද්‍යා අංගය ......................................................................................................... යනුවෙන් හැඳින් වේ.

**35.** **J** අක්ෂරයෙන් දැක්වෙනුයේ ......................................................... නිරූපණය වන පොළොන්නරු වටදාගෙයට අයත් මුරගලයි.

- ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න.

**36.** **තේමාව** :..........................................................................................................

..........................................................................................................

**37.** **ශෛලිය** :..........................................................................................................

..........................................................................................................

**38.** **ස්ථානය** : ..........................................................................................................

..........................................................................................................

**39.** **සංරචනය** : ..........................................................................................................

..........................................................................................................

**40.** **රූප හා වර්ණ භාවිතය :** ..........................................................................................

..........................................................................................................

*******